# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2365/66 – 2024 ජනවාරි මස 04 වැනි බ්‍රහස්පතින්දා – 2024.01.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/22/05/2013.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.08.05 දිනැති හා අංක 2135/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.07.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නත්තරම්පොත, කුණ්ඩසාලේ, පඩිවත්ත හි පදිංචි එම්. ඒ. රණසිංහ මයා සහ කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, එයාර්ලයින් සෙන්ටර් හි පිහිටි ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 75/2019 හා 2023.11.23 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 දෙසැම්බර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

එම්. ඒ. රණසිංහ මයා,
පඬිවත්ත, කුණ්ඩසාලේ,
නත්තරම්පොත.

IR/22/05/2013

*පළමු පාර්ශ්වය*

නඩු අංකය - A/75/2019

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්
එයාර්ලයින් සෙන්ටර්,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ,
කටුනායක.

*දෙවන පාර්ශ්වය*

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ආර්. එස්. ආරියප්පෙරුම වන මා 2019.07.29 වන දින පත්කර එය මා වෙත යොමුකර ඇත.

එකී යොමු කිරීමට අනුව,

''ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් ලිමිටඩ් හා ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය අතර 1996.11.01 දින සිට 1999.05.31 දින දක්වා කාලයට අදාළව ඇති කරගන්නා ලද ගිවිසුම ප්‍රකාරව එම සංගමයේ සාමාජිකයින්ට ලබාදුන් වැටුප් වැඩිවීම අදාළ ආයතනයේ අභ්‍යන්තර ගුවන් සේවා සත්කාරක වශයෙන් සේවය කළ එම්. ඒ. රණසිංහ මහතාට ලබා නොදීම යුක්ති සහගතද? එසේ යුක්ති සහගත නොවේනම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද?'' යන්න පිළිබඳව වේ.

දෙපාර්ශ්වයේ පළමු හා දෙවන ප්‍රකාශ ඉදිරිපත් කළ පසු හා දෙපාර්ශ්වයම විරෝධතා සහ ප්‍රතිවිරෝධතා ඉදිරිපත් කළ පසු සජීවී ආරාවුලක් ඇති බව සහ කාලාවරෝධයක් වී ඇතැයි විත්තියෙන් විරෝධතා දැක්වුවත්, සාප්පු හා කාර්යාල පනත යටතට මෙම සේවකයාගේ ගැටළුව අදාළ වී නැති බැවින් සහ සේවයෙන් ඉල්ලා අස්වූ 2012.11.06 වන දිනට පෙර සහකාර කම්කරු කොමසාරිස් මීගමුව වෙත 2012.10.05 දින තම පෙත්සම ඉදිරිපත් කර ඇති බැවින් කාලාවරෝධයක් වී නැත. (ලංකාවෙන් පිටත්වී දින 10 කට පසු සේවය ආරම්භ කර ඇති බව හරස් ප්‍රශ්න වලදී සාක්ෂි දී ඇත. තවද R5 ලිපියෙන් තමාට හිමි නිවාඩු යොදා ගන්නා ලෙස ද දක්වා ඇත.)

ඉල්ලුම්කරු ඔහු සාමාජිකත්වය නොදැරූ ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය 1996 දී දෙවන පාර්ශ්වය අතර සාමූහික ගිවිසුමක් ඇති කරගෙන ඇති බවත් එය කම්කරු කොමසාරිස්තුමා පිළිනොගත් අතර *ගැසට් පත්‍රයේ* පළ නොකළ බවත් (A3) එහි පැවති කොන්දේසි සහ ව්‍යාකූල කරුණු නිසා එම ගිවිසුමට තමා හා කිහිපදෙනෙකු අත්සන් නොකළ බවත් දිව්රුම් පෙත්සමේ සහ සාක්ෂි දෙමින් කියා ඇත. ඒ අනුව 1996.06.01 සිට රු. 2000/- කින් ද, 1997.06.01 දින සිට රු. 400/- කින් ද, 1998.06.01 දින සිට නැවත රු. 400/- කින් ද වැටුප් වැඩි වූ බවත් එය තමාට ක්‍රියාත්මක නොකළ බව කියා සිටින ලදී. ඒ පිළිබඳව 2012.07.02 සහ 2012.10.30 දින දරන (A4 සහ A5) ලිපි මඟින් පාලන අධිකාරියේ අවධානයට යොමු කළ බව ද කියා ඇත. ඔහුගේ ඉල්ලීම විමර්ශනය කළ කැකුලාවල නමැති මානව සම්පත් කළමණාකරු වැටුප් හා හිඟ මුදල් ගෙවන බවත් දැනට ද සේවයේ නියුතු ඉල්ලුම්කරුගේ අංශයේ මානව සම්පත් කළමණාකාරිනී බුද්ධිකා මානගේ මෙනවියට උපදෙස් දෙනු ලැබූ බවත් මානව සම්පත් අංශයේ සේවය කළ ලසන්ත ලියනගේ නිලධාරියා මේ සඳහා යොමු කළත් ඉල්ලුම්කරුගේ ඉල්ලීම ඉටු නොවූ බව කියා සිටින ලදී.

ඉල්ලුම්කරු හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් කියා සිටියේ,

ප්‍ර. තමා (R2) දරන සාමුහික ගිවිසුමේ තිබෙන කොන්දේසිවලට එකග නෑ. ඒවා අයහපත් ව්‍යාකුලයි කියා තමා එයට අත්සන් කළේ නෑ නේද?

පි. අත්සන් කලේ නෑ. එහි තිබෙන සමහර වගන්ති අයහපත් සහ විශේෂයෙන් පඩි වැඩිවීම, අත්සන් කිරීම නිසා සිදු වන්නක් නොව සැමට සාධාරණ ලෙස කරන සේවය අනුව ලැබිය යුතු බව කම්කරු නීතියේ සඳහන් බැවින් මා එයට අත්සන් කිරීමට පෙළඹුනේ නෑ.

ප්‍ර. නීත්‍යානුකුල නොවන “R2” ලේඛනයෙහි තිබෙන ප්‍රතිලාභ නොලැබීම සම්බන්ධයෙන් තමයි තමුන් මේ පිහිට පතන්නේ.

පි. “නැත. මා පිහිට පතන්නේ මා හා සමාන සේවය කරන සේවකයින්ට ලබා දුන් වැටුප් වරප්‍රසාද මට ලබානොදීම පමණයි. එය මේ ලිපියට අදාළ ද නැද්ද යන්න කියන එක නොවෙයි. මා සඳහන් කරන්නේ මා හා සමාන සේවකයින්ට ලබාදෙන වැටුප් මට ලැබීමට තිබෙනවා කියන එක. සමාන අයිතිවාසිකමක් මා ඉල්ලා සිටින්නේ”

ඉහත කී ඉල්ලුම්කරුගේ ප්‍රකාශය ඉතා බරපතල නෛතික ප්‍රකාශයක් වෙයි. එසේම ඉල්ලුම්කරු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කියා සිටියේ මා සමග මේ ගිවිසුමට අත්සන් නොකළ මංගල සිරිවර්ධන යන අයට මෙම වැටුප් විෂමතාවය සම්බන්ධයෙන් නීත්‍යානුකුල පියවර ගෙන හිඟ වැටුප් ඔහුට ගෙවීමට අධිකරණය නියෝග කළ විට එය සේවා යෝජකයා පිළිගෙන සියලු ගෙවීම් කිසිදා හිඟයකින් තොරව මේ ගිවිසුම සඳහා අත්සන් නොකළ මංගල සිරිවර්ධන යන අයට ලබා දී ඇති බව ප්‍රකාශ කර ඇත.

එම කාලය තුළ තමාටත් එකී ප්‍රතිලාභ අහිමි වී ඇතැයි කියා දැන සිටියාද කියා ඇසූ ප්‍රශ්නයට ඔහු දෙන ලද පිළිතුර වූයේ මංගල සිරිවර්ධන මෙම වැටුප් නොලැබී මේ ඉල්ලීම කළ පසු බොරු චෝදනාවක් යටතේ රැකියාවෙන් ඉවත් කිරීමට කටයුතු කළ බවත් මා එම ඉල්ලීම කරානම් මට අත්වන ඉරණම දන්නා නිසා මා ඇතුළුව කීප දෙනෙක් මේ සඳහා ඉල්ලුම්කිරීමට ඉදිරිපත් නොවූ බවත් මම පැමිණිලි කළානම් ආරක්ෂක අංශයේ අය බොරු චෝදනා ඉදිරිපත් කර තාවකාලිකව හෝ රැකියාවෙන් ඉවත් කරන බව මූණටම පවසන ලද බව සාක්ෂි දෙමින් කියා සිටින ලදී.

ප්‍ර. තමුන්ට යෝජනා කර සිටිනවා තමුන්ට මෙම ගිවිසුමෙන් පැන නැගුණු ප්‍රතිලාභ ඉල්ලා සිටීමේ අයිතියක් නැතිවුනේ එකග නොවූ ගිවිසුමක් නිසා.

පි. එය ප්‍රතික්ෂේප කරනවා. අපේ කම්කරු නීතියේ හැටියට සමාන සේවයක් කරන අයට ප්‍රතිලාභ ලබා දීමේදී සමානව, වෙනස්වීමකින් තොරව එය ලබා දීම අප නීතියේ සඳහන් මූලික කරුණක්. මංගල සිරිවර්ධන සහ ශ්‍රී ලංකා එයාර්ලයින්ස් ආරාවුලේ දී මෙන්ම ශ්‍රී ලංකා එයාර්ලයින්ස් සමාගම ද පිළිගෙන හිඟවැටුප් පවා ගෙවීමට කටයුතු කර තිබෙනවා.'' (මෙම කරුණ 1950-43 පනතේ 8-2 සහ 12.1 හා 12.6 වගන්ති මගින් ද නියම කරන ලද නියමයන් වෙයි.)

ප්‍ර. ආර් 2 ලෙස ලකුණු කරන ලද ගිවිසුමේ කොන්දේසිවලින් තමුන්ට ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාවක් නැතැයි යෝජනා කළ විට ඉල්ලුම්කරුගේ පිළිතුර වූයේ,

පි. ''මෙය නීත්‍යානුකුල නොවන ගැසට් නොකළ ලියවිල්ලක් දෙවනුව එක හා සමාන රැකියාව කරන සේවකයින් මූලික වැටුප තීරණය වන්නේ ඔහු කරන සේවය හා ඒ ඒ අවස්ථාවලට අදාළ ජීවන වියදම් මූලික කරගෙන බවයි.''

ආයතනය පඩිවැඩිවීමේ ලේඛන ආර් 3 ආර් 4 වැනි ලේඛන අනුව ලබා ඇති පඩි වැඩිවීම සම්බන්ධයෙන් ප්‍රශ්නකළ විට ඉල්ලුම්කරු කියා සිටියේ මේවා වාර්ෂික වැටුප් වර්ධකය මිස මෙය මාගේ මූලික වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීමක් නොවෙයි''

මෙරිට් ඉන්ක්‍රිමන්ට් එකක් ලබාදීම සාමාන්‍ය වර්ධකයට අමතරව විශේෂ වර්ධක ලබා දී ඇත. පාලන අධිකාරියට ''ලිඛිතව නොව අපි වාචිකව දැනුම් දුන්නා ………… අප පාලන අධිකාරිය සමග සුහදව කටයුතු කළත් ඔවුන් එවකට පැවති දේශපාලන වාතාවරණය අනුව සමිතියට එරෙහිව කිසිම තීරණයක් ගැනීමට ඉදිරිපත් නොවුනි.''

අපට දැනුම් දුන්නේ මඳක් ඉවසා, මෙය සමථයකට පත් කර දී ඉවර කරන ලෙසයි. ''හරස් ප්‍රශ්න ලෙස ඉල්ලුම්කරු ආයතනයෙන් අස්වීමට හේතුව ඇසූවිට ඔහු දෙන පිළිතුර වූයේ ''මම ඉල්ලුම්කළා...... ප්‍රශ්නයක් තිබුණේ මට බලපෑම් කලේ යුනියන් එක මා බොරු චෝදනාවකට තාවකාලිකව වැඩ තහනම් කළා. කිසිම විභාගයක් හෝ පරීක්ෂණයක් නොකොට එය බොරු චෝදනායක් බව ඔප්පු වුනාට පසු මාව වැඩට ගත්තා. වැඩට ගත් දවසේ සිට මට තිබූ පහසුකම් ඉවත් කළා. ආරක්ෂක අංශ නොයෙකුත් බලපෑම් එල්ල කරන බවට හැඟී ගියා. මේ අවස්ථාවේ මම අස්වීමට තීරණය කළා'' යැයි පිළිතුරු දී ඇත. තවදුරටත් පිළිතුරු දෙමින් ''බොරු චෝදනා නගලා මෙයින් අපහසුතාවයටත්, නීතියේ පිහිටත් පතන්න වුනා. මගේ සාක්කුවටත් මොනවහරි දාලා මාව හිරේ යවන්න පුළුවන්...... නීතියේ පිහිට පැතුවේ නැහැ.''

ආර් 7 නමැති ලේඛනයක් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න කිරීමේ දී හෙළි වූ කරුණු අනුව ජනාධිපති ආරක්ෂක අංශය විසින් ඉල්ලුම්කරුගේ රාජකාරියට කළ අවහිර කිරීමක් නිසා ඔහුට විරුද්ධව චෝදනා එල්ල කළත් පරීක්ෂණ නොපවත්වා නැවත සේවයේ පිහිටුවා ඇති බවයි. එහිදී ආර් 6 ලේඛනය ප්‍රතික්ෂේප කර ඇත. මෙම ප්‍රශ්න නඟා ඇත්තේ ඒ 2 ලබා නොදුන්නත් ආයතනය ඉල්ලුම්කරුට සාධාරණය ඉටුකළ බව (ආර්7, ආර්8) පෙන්වීමටය. එය අදාළ විසඳිය යුතු ගැටළුවට මෙය පිළිතුරක් නොවේ.

2023.05.16 දින විත්තියේ එකම සාක්ෂිකරු රෝෂන නවින්ද වික්‍රමසිංහ මානව සම්පත් කළමණාකරු වශයෙන් සාක්ෂි දෙමින් ආර් 2 ලෙස ලකුණු කළ සාමූහික ගිවිසුමේ 10 වන පිටුවේ 5 වන ඡේදයේ තිබෙන 1995.10.01 සිට රුපියල් 1200.00 ක් ද එය 1996.11.01 දින සිට මෙම දීමනාව වැටුපට එක්වෙන බව ද සඳහන් කර ඇත. 5 වන ඡේදයේ බී කොටසින් 1996.11.01 සිට රුපියල් 800.00 ක වැටුප් සංශෝධනයක් විය යුතු බව ද පිළිගෙන ඇත. 1997.04.01 දින සිට රුපියල් 400.00 කින් ද 1998.01.01 සිට රුපියල් 400.00 කින් ද වැටුප් වැඩිවී ඇත.

විත්තියේ ආර් 13 ගණනය කිරීම හා ඉල්ලුම්කරු ඉදිරිපත් කළ ඒ 10 ලේඛනයේ ගණනය කිරීම් වෙනස්කම් ඇති බව සාක්ෂිකරු පිළිගනී.

ප්‍ර. දැන් මහත්මයා පිළිගන්නවාද මේ සාමූහික ගිවිසුම අනුව ඉල්ලුම්කරුට මේ වැටුප් වැඩිවීම් සිදුවුණේ නැහැ කියලා?

පි. එහෙමයි.

ඉල්ලුම්කරුගේ නීතිඥ මහතා විසින් ඒ 5 ගෙවිය යුතු හිඟ මුදල් පිළිබඳ දක්වා ඇත. සාමූහික ගිවිසුමේ නොවන ආයතනය ප්‍රදානය කරන ලද දීමනා ද ඉල්ලුම්කරුට ලබාදී නැති බව සාක්ෂිකරුගේ හරස් ප්‍රශ්නවලදී සනාථ වේ. ''මෙම මුදල් ප්‍රමාණය දීමනා විදිහට මෙම මහත්මයාට දිගටම ගෙවුනා විය යුතුයි.'' සමහරවිට උපකල්පනය වැනි අවිනිශ්චිත වචන භාවිතාකර පිළිතුරු ලබාදී ඇත.

ප්‍ර. ඒ අනුව ඔබ ගණනය කරලා තිබෙන සම්පූර්ණ මුදල හිඟ වැටුප් වශයෙන් රු. 784537/- ක්

පි. එහෙමයි.

ප්‍ර. රු. 1200/- මුදල ගෙවිල තිබෙනවද? කියලා හරියට නිශ්චිතව පැහැදිලි කරන්න.

පි. මගෙ දැනුම අනුව ගෙවිල නැහැ. හැබැයි දීමනාවක් විදියට ගෙවිලා...... 1200/- එකතු කර අවසානයේ අවසාන වැටුප් මට්ටම තීරණය කරලා ඒ අනුව පාරිතෝෂික ගණනය කිරීමේ වෙනසක් තිබෙනවා කියා මට පේනවා. වර්ෂය අවසාන ආයතනය කුමන නමකින් හෝ දීමනා ගෙවන බවත් අර්ථසාධක අරමුදලට එක්විය යුතු මුදල ආර් 13 ගණනයට වඩා වෙනස් බවත් පිළිගෙන ඇත.

ආර් 13 ලේඛනයේ අර්ථසාධක සහ සේවා භාර අරමුදලේ හිඟ මුදල ගණනයේ දී රු. 1200/- ක මුදල අතහැරුනේද කියා පැමිණිල්ලේ නීතිඥ මහතා අහන ප්‍රශ්නයට පිළිතුර ''එහෙමයි'' කියා, කියා ඇත. ''රු. 1200/- ක දීමනාව 1995 සිට වැටුපට එකතු කර තිබෙනවා, එම එකතු කිරීම පිළිබඳ ආර් 2 ලේඛනයෙන් නිශ්චිතව කරුණු දැනගැනීමට එම කාලයට අදාළ වාර්තා නොමැතිවීම පිළිබඳ ප්‍රශ්නයක් යැයි පිළිතුරු දී ඇත. එසේම අවු. 26 කට පෙර වාර්තා තබා ඇත්තේ පරිගණක ක්‍රමයට නොවන නිසා වැටුප් වාර්තා මේ වන විට ආයතනයේ නැතැයි'' සාක්ෂි දී ඇත.

රුපියල් 1200.00 වැටුපට එකතු කළානම් පාරිතෝෂික ගණනය කිරීමේදී වෙනසක් ඇති බව පිළිගෙන ඇත. වැටුප මත ගෙවන ප්‍රසාද හෝ කුමන නමක් යටතේ වසර අවසානයේ ගෙවන ලද දීමනා ඉල්ලුම්කරුට ලැබී නැතැයි යෝජනා කළ විට ''අඩුවක් තිබෙනවා නම්, අඩුව ඉදිරිපත් කරන්නේ නැතුව වෙනස ගණනය කළ නොහැකි යයි'' සාක්ෂි දී ඇත. 2022.02.08 වන දින වගඋත්තරකරු මූලික සාක්ෂි දෙමින් නිවාඩු දිරි දීමනා, අතිකාල පෝය දින, නිවාඩු දිනවල වැඩ කිරීම් හා ව්‍යවස්ථාපිත ගෙවීම් පිළිබඳ ඒ 10 ලේඛනයේ ගණනය කර ඇති බව ප්‍රකාශ කළත් එම නිසා එය තහවුරු කර ඇති බව කිව්වත් මෙම ඒ10 තොරතුරු ලේඛනය 2023.01.30 ගොනු කර ඇති අතර හා 2016.05.16 සාක්ෂි අවසන් කිරීමට පෙර හෝ 2022.07.06 වන දින සටහන් නිවැරදි කළ අවස්ථාවට පෙර හෝ ආර් 23 හි වෙනස්කම් ඇතැයි පිළිගත් අවස්ථාවන් නිවැරදි කිරීමට මාස 6 ක කාලයක් තිබිණි.

''අවිනිශ්චිත යැයි පරිශීලනයට අවශ්‍ය යැයි උපකල්පනය කරනවා යැයි කියූ හා පසුව තහවුරු කරනවා යැයි කරන ලද ප්‍රකාශ ප්‍රකාශවලට පමණක් සීමා විය.'' මෙම තොරතුරු පෞද්ගලික ලිපිගොනුවල තිබිය යුතු බවත් එය ඉල්ලුම්කරුගේ වරදක් නොවන බවත් පැහැදිලිය.

2023.01.30 හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් 1996 ඉල්ලුම්කරු ඉල්ලා අස්වන තෙක් ආර් 2 ගිවිසුමේ වැටුප් වැඩිවීම් අතිකාල, සේවක අර්ථ සාධක ආදිය වැඩිවිය යුතු බව පිළිගෙන ඇත. වැටුප් වැඩිවීම්, ප්‍රසාද දීමනා, දිරි දීමනා, නිවාඩු, ඉතිරි කරගත් නිවාඩු ආදිය සම්බන්ධව තීරණය කළ යුතු වන්නේ අදාළ සාමූහික ගිවිසුම අනුව පරිශීලනය කර ඊළඟ දිනයේදී පිළිතුරු ලබාදෙන බව කීවත් එය ඉටු නොකරන ලදී.

එසේම සේවකයාට නිකුත් කළා කියන ලිපි සහ එම ලිපියට එවන ලද පිළිතුරු පෞද්ගලික ලිපිගොනුවේ හෝ වෙනත් තැනක තිබිය යුතු බව පිළිගත්තත් දීර්ඝ කාලයක ඒවා බැවින් ආයතනය සතුව අද වන විට නැති බව කියා සිටී. ආර් 2 ගිවිසුමේ අංක 4 සිට අංක 15 දක්වා වැටුපට අමතර කරුණු ද ඇතුළත් බව සාක්ෂිකරු පිළිගනී. මෙම ගිවිසුම නිසා සේවක අත්පොත නිශේධනය නොවන බව ද පිළිගන්නා ලදී.

ආර් 2 ලේඛනයේ 15 වන ඡේදයේ 15 A යටතේ රුපියල් 1200.00 කින් වැටුප් වැඩිවන බව පිළිගෙන ඇති අතර ආර් 13 ලේඛනයේ එම වැඩිවීම 1996.11.01 සිට එකතුවී නොමැති බව ආර් 13 ලේඛනයේ සඳහන් වන්නේ නැහැ නේද කියා ඇසූ පැනයට ''නැහැ'' කියලා පිළිතුරු දී ඇත.

ප්‍ර. සාක්ෂිකරු ආර් 13 නිවැරදි වෙන්න නම් ආර් 2 ලේඛනයේ 15 ඒ යටතේ තිබෙන රුපියල් 1200.00 ක් එකතු වෙන්න ඕනේ නේද?

පි. ඊළඟ දිනයේදී මා එයට නිශ්චිත පිළිතුරක් ලබාදෙන්නම්. අදාළ ලිපි ලේඛන පරීක්ෂා කරලා බලා ඉදිරිපත් කරන්නම්. (2023.01.30 සාක්ෂි දෙමින් කියා සිටින ලදී)

මෙම රුපියල් 1200.00 ක වැඩිවීම ඉල්ලුම්කරුගේ වැටුපට එකතුවී නැතැයි යෝජනා කළ විට එය එකතු වී නැතැයි මා උපකල්පනය කරනවා යැයි සාක්ෂිකරු කියා සිටින ලදී. එම එකතු නොවීම නිසා පාරිතෝෂිකය අඩුවෙන් ගෙවලා තිබෙන බවත් පිළිගනී. වැටුප් වැඩි නොවූ නිසා නිවාඩු, අතිකාල සහ පෝය දින වෙනුවෙන් රුපියල් 87,254.00 ක් අඩු වූ බව කීවත් සාක්ෂිකරු නිශ්චිතව පිළිනොගනී.

එහෙත් Claim Around Shortage Per Year කියලා පිළිඅරගෙන තිබෙනවා. එම හිඟ දීමනාවත් රුපියල් 132,000.00 කියලා එයට දෙන පිළිතුර අවිනිශ්චිත පිළිතුරකි. එයට ලබාදුන් පිළිතුර වන්නේ ''මේ විදිහට ගෙවුනා නම් මේ විදිහට ගෙවිය යුතු නම් අඩුවක් තිබෙනවා'' යයි අවිනිශ්චිත පිළිතුරක් දෙන ලදී. අර්ථ සාධක අරමුදල් ලෙස 264692.00 හිඟ ඇති බවත් හා ඉල්ලුම්කරු රුපියල් 2711765.00 ක මුදල් හිඟ වැටුප් හා අනුශාංගිකව ගෙවීම් ලෙස ගෙවිය යුතු බව යෝජනා කළ විට පිළිනොගත්තත් වෙනසක් ඇති බව පිළිගනී.

අවශ්‍ය නම් නැවත ප්‍රති ගණනය කිරීමක් කළ හැකි බව 2023.05.16 දින සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටියත් එවැන්නක් ඉදිරිපත් නොකරන ලදී. අවසාන ලෙස අදාළ කාලයට අදාළ වාර්තා කිසිවක් මේ වෙනකොට ආයතනය සන්තකයේ නොපවතින බවට සාක්ෂි දෙන ලදී.

ඉහත සඳහන් ලේඛන හා සාක්ෂි අනුවත් දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති ගණනය කිරීම් සළකා බලා ඉල්ලුම්කාර පාර්ශ්වයෙන් ඒ 10 යටතේ ඉල්ලා ඇති රුපියල් 3,026,455.00 (තිස් ලක්ෂ විසිහයදහස් හාරසිය පනස් පහ) ක මුදල මීගමුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත මෙය ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත තැන්පත් කරන ලෙස වගඋත්තරකරුට නියම කරමි.

මෙම තීරණය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

**ආර්. එස්. ආරියප්පෙරුම,**
බේරුම්කරු.

2023 නොවැම්බර් මස 23 වැනි දින දී ය.

EOG 01 – 0044

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.